මගේ අංකය: ජේඑස්සී/ඊජ්/ස්ථානමාරු - 2025

සියලුම මහාධිකරණ විනිශ්වයකාරවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ/ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී, වැඩසටහන් සහකාර සහ ගිණුම් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මගේ සමාංක හා 2024.07.19 දිනැති ලිපියට අතිරේක වශයෙනි.

02. USAID සංවිධානය සමග එක්ව අධිකරණ සේවා කොමිෂන් සභාව දියත් කර ඇති ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය (Model Courts initiative) ක්‍රියාත්මක වන අධිකරණ වල සේවය කරන එම ව්‍යාපෘතියට අදාලව පුහුණුවීම් ලබා ඇති උපලේඛනගත සේවයේ නිලධාරීන් සහ/ හෝ සංවර්ධන නිලධාරීන්, වැඩසටහන් සහකාර සහ ගිණුම් සහකාර නිලධාරීන් එම ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ස්ථානමාරු නොකර ඉදිරි වර්ෂය සඳහාද රඳවා තබා ගැනීමට අවශ්‍ය වන්නේනම් එවැනි ඉල්ලීම් සාමාන්‍ය ස්ථානමාරු ප්‍රතිපත්තියට පරිබාහිරව විශේෂකොට සැලකීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. ඒ අනුව ස්ථානමාරු නොකර රඳවා තබා ගැනීමට අවශ්‍ය එවැනි නිලධාරීන් සිටීනම් අවශ්‍ය සාධාරණීකරණයන්ද සමඟ ඒ පිළිබඳ ඉල්ලීම් 2024.08.30 දිනට පෙර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2024 අගෝස්තු මස 23 වෙනි දින,
කොළඹ - 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12